




රසික සූරියආරච්චි

# හෝඩියේ පන්තියේ සිත්තරාවිය

දවසේ පැය විසි හතරෙන් අප අවදිව සිටින එයින් තුනෙන් දෙකකටත් වැඩි කාලය පුරා, වසරේ තුන්සිය හැටපස් දවස පුරා, අප අවට සිදුවන, අප නෙත් ගැටෙන, අපට අසන්නට ලැබෙන, අප අත්දකින, සියක් දහසක් දර්ශන, සංසිද්ධි, කතාබහ අතරින් වසර ගණනාවකට පසුවද නොමැකී මතකයේ රැඳී තිබෙන්නේ කවර ඒවාද යන්න තීරණය වෙන්නේ කුමන සාධක මතද යන්න මට සැමදා ඇති ප්‍රශ්නයකි.

අද කළ යුතු දේ අමතක වුවද, ඊයේ රාත්‍රියේ ආහාරයට ගත්තේ මොනවාදැයි දැන් මතකයේ රැඳී නොමැති වුවද, දශක ගණනාවකට කලින් එක් දිනයක සිදුවුණු සමහර අති සරල කුඩා සිදුවීම් අද ද මතක පොතෙන් නොමැකී තිබීම පුදුමයක් ම වේ.
මේ එවැනි එක් සුන්දර මතකයක් ඔබ හා බෙදා ගන්නට කාලයයි.

කාලය: 1968 වර්ෂය
ස්ථානය:
කොස්සින්න කණිෂ්ඨ විද්‍යාලයේ හෝඩියේ පන්තිය
හෝඩියේ පන්තිය හෙවත් පළමුවැනි ශ්‍රේණියේ සිටින සිසුන් සඳහා විෂය නිර්දේශයක් එදා තිබුණෝදැයි මම නොදනිමි. එවැන්නක් තිබෙන්නට ද ඇත. නොතිබෙන්නටද ඇත.

ඒ කෙසේ වෙතත් එදා අප කළේ හෝඩි පොත කියවීමයි. අකුරු ලිවීමයි. චිත්‍ර ඇඳීමයි. ඒ මොනවා ලිව්වත්, ඇන්දත් ඒ සඳහා අපට තිබුණේ එකම උපකරණයකි. එනම්, අද පෑඩ් නමින් හැඳින්වෙන ගැජට්ටුවේ ආරම්භය වූ ගල්ලෑල්ල සහ අද ස්ටයිලස් නමින් හැඳින්වෙන ගැජට්ටුවේ ආරම්භය වූ ගල්කූරයි.

අකුරු ලිවීම මට ලෙහෙසි කටයුත්තක් විය. අපට තිබුණේ එක්කෝ හෝඩි පොතේ සාමා හෝ අමර ගැන ලියවී තිබුණු වචනයක් ගල්ලෑල්ලේ ලිවීමයි. නැතිනම් අපේ පන්තිය භාර ඥාණවතී ටීචර් කළුලෑල්ලේ ලියන අකුරක් හෝ වචනයක් ගල්ලෑල්ලේ ලිවීමයි. සමහර විට එකම අකුර හෝ වචනය කීප පාරක්ම ගල්ලෑල්ලේ ලියන්ට සිදුවිය.
එය එසේ වී නමුදු මට අසීරු කාර්යය වූයේ අදත් මට විශාල අභියෝගයක් වන චිත්‍ර ඇඳීමයි.

අප මේ කතාකරන්නේ පාට පැන්සල් හෝ පැස්ටල් කූරු හෝ දිය සායම්වලින් සුදු කොළ මත චිත්‍ර ඇඳීමක් නොවේ. ගල්ලෑල්ල මත ගල්කූරෙන් චිත්‍ර ඇඳීමයි. මේවා වචනයේ අර්ථපරිසමාප්ථාර්ථයෙන් ම කළු සුදු රේඛා චිත්‍ර විය.

එසේම මේ සඳහා අපට ලැබුණේ ද පස් වසරක ළමා සිතකින් ඔබ්බට යන අභියෝගාත්මක මාතෘකා යැයි අද මට සිතේ.
ඥානවතී ටීචර් අපට ඇඳීමට නියම කළ මගේ මතකයේ රැඳී ඇති එක් චිත්‍රයක් වනුයේ චිත්ත මෝස්තරයකි.
අපේ ආච්චී නිවසට, අහල පහළ ගමන් යාමට, ඇන්දේ චීත්තය. අම්මා ඇඳි දිගැති ගවුම් වුවද මසා තිබුණේ චීත්ත රෙද්දෙනි. ඒවායේ තිබූ මෝස්තර, පොඩි මල්, ලොකු මල්, ඉරි, තිත් යනාදී ලෙසින් විස්තර කළ හැකිවුවද ඒවා ළමා සිතකට සරල ඒවා නොවීය. මෙහිදී වැදගත්වන අනිත් කරුණ නම් වදෙන් පොරෙන් එක මලක් ඇඳගත්තා වුවද, ඒ හා සමාන රුවෙන් යුතු තවත් මල් රාශියක්ම ඇඳ මෝස්තරයක් මවන්නේ කෙසේද යන්නයි.

මේ දැවෙන ප්‍රශ්නයෙන් මා ගලවාගෙන ඉතා සරල නමුත් ශූර විසඳුමක් මට ලබා දුන්නේ හෝඩියේ පන්තියේ මගේ පුටුවට ඉදිරිපස පුටුවේ වාඩිවී සිටි රාණිකා කිරිබත්ගොඩ දැරියයි.

වසර හතළිස් හතරකට පසුව අදත් මගේ සිතේ නොමැකී පැවතෙන ඒ චීත්ත මෝස්තරය අඳින ආකාරය පහත පරිදි වේ.



පළමුව, ගල්ලෑල්ල පුරා දිග්අතට සහ හරස් අතට එක සමාන අඟලක පමණ පරතරයකින් යුතුව ඉරි ඇඳ කොටුරූල් පොතක මෙන් සකසා ගන්න.

දෙවනුව ඒ කොටුවල විකර්න රේඛා ඇඳගන්න. තෙවනුව, තිරස් සහ සිරස් රේඛා සහ ගැලපෙන විකර්න රේඛා මැදිවන පරිදි ඒ දිගේ කොටුවල කොන් යා කරමින් සිහින් දිගැති මල් පෙති අඳින්න.



අවසානයේ තිරස්, සිරස් සහ විකර්ණාව ඇඳි රේඛා මකා දමන්න. අටපෙති මල් මෝස්තරයක් එහි මැවෙනු ඇත.



මේ චීත්ත මෝස්තරය ඇඳීම පිළිබඳව රානිකාට සමහරවිට වැඩිහිටියෙකුගේ උපදෙස් ලැබෙන්නට ඇත. එසේ වුවද, ඒ ආකාරයෙන් මල් මෝස්තරයක් නිර්මාණය කිරීම පස් වසරක් වයැසැති ළමයෙකුට එක්තරා ආකාරයකට විශ්ම කර්ම ක්‍රියාවක් විය.

රාණිකා ගෙන් මා උගත් දෙවන චිත්‍රකර්ම පාඩම වූයේ මුහුදු වෙරළක දර්ශනක් ඇඳීමයි. එය චීත්ත මෝස්තරයකට වඩා විස්තර සහිත, නමුත් පෙරටත් වඩා ශූර නිර්මාණයක් විය.
කුඹුරු, ලියැදි, කමත්, ගුරුපාර, දෙවට, බඩවැටිය, කලාතුරකින් බසයක් යනෙන තාරපාර, පොල් ගස්, කජු ගස් පිරි වතු, පන්සල, පාර දෙපස තැන තැන පිහිටි කුඩා සිල්ලර කඩ වැනි අංගයන්ගෙන් සමන්විත ගම්බද පරිසරයක් ජීවත්වුණු අපට මුහුදු වෙරළ යනු හුරු පුරුදු දර්ශනයක් නොවීය.

අපේ ගම්මානයේ සිට කොළඹට තිබුණේ සැතපුම් පහළොවක පමණ දුරකි. ඒ ගෝල්ෆේස් යනවා නම් ය. කඳාන හෝ ජාඇල හරහා බටහිර මුහුදු වෙරළට ළඟාවීම නම් ඊට වඩා අඩු දුරක් ගෙවා කළ හැකි විය. නමුත් අපේ පන්තියේ මා ඇතුළු බහුතරයක් සිසුන් ට මුහුදු වෙරළක දර්ශනයක් සිතින් මවා ගැනීම මහා අභියෝගයක් වූවාට සැක නැත.

ඒ අභියෝගය ජයගන්නා හැටි රාණිකා මට කියා දුන්නේ මෙලෙසය.

පළමුව ගල්ලැල්ල දෙකට බෙදෙන පරිදි තිරස් ඉරක් අඳින්න. මෙය ක්ෂිතිජ රේඛාවයි.



මේ රේඛාව උඩින් අඩක් ගිලෙන හිරු ද, නවතා ඇති නැවක් ද සරල ඉරි කිහිපයකින් අඳින්න.

අහසේ පියාඹන කුරුල්ලන් රංචුවක් එකතු කරන්න. මේ සඳහා අවශ්‍යවන්නේ ද ගල්කූරෙන් කුඩා රේඛා කීපයක් ඇඳීම පමණි.
දැන් මුහුද ඇති කොටස පුරා රැළි මාලාවක් අඳින්න. අවශ්‍ය නම් බෝට්ටුවක් ද එකතු කරන්න. වෙරළ අයිනෙන් පොල් ගසක් හෝ දෙකක් සරල රේඛා කීපයක් මගින් ඇඳ ගැනීමත් සමගම චිත්‍රය සම්පූර්ණ වේ.



මේ සරල ක්‍රමවේදය අනුගමනය කිරීමේදී ගල්කූරු පහරින් ගල්ලැල්ල මත මැවෙන්නේ අනර්ඝ රේඛා චිත්‍රයක් බවට ඔබ මා සමග එකඟවනු ඇත.

එදා මට හෝඩියේ පන්තියේදී චිත්‍ර කර්මය කියා දුන් රාණිකා කිරිබත්ගොඩ නම් සිත්තරාවිය මා පරදවා පන්තියේ පළමුවැනියා වූවාය. පසුව කොළඹ විශ්ව විද්‍යාලයෙන් වෛද්‍යවේදී උපාධිය ලබාගත් ඇය අද හෘද රෝග පිළිබඳ විශේෂඥවරියෙකි.

මා ලියන මේ ලිපිය ඇය කියවන්නට ඉඩ ඇතත්, සූසාලිස් වසරකට පෙර සිදුවූ මේ සිදුවීම ඇගේ මතකයේ රැඳී තිබේදැයි මට සැක සිතේ. ■

---

4 වන පිටෙන්

දෝෂාභියෝගයක් ගෙන ඒම සඳහා චෝදනා ගොණු කෙරුණාද කියන කාරණය ගැන මෙතනදි අපිට ටිකක් හිතන්න වෙනවා.

ඇයට විරුද්ධව විෂමාචාර චෝදනා 14ක් ඉදිරිපත් වෙලා තියනවා. දැන් මේ චෝදනා පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවක් ඉදිරියේ විභාගවීමට නියමිතවයි තියෙන්නේ. මෙතනදි ඒ සභාව අධිකරණයක් ලෙසයි ක්‍රියාකරන්නේ. ඒ නිසා ඉදිරිපත්වෙලා තියන චෝදනා 'විෂමාචාරය' කියන වරද යටතට වැටෙනවාද, නැත්ද ආදී දේ ගැන නීතිමය කරුණු පැහැදිලි කිරීමක් කරන්න මේ අවස්ථාවේදී මට පුළුවන්කමක් නෑ. මොකද ඒ ගැන අපි කතා කළොත් ඒක අධිකරණයට කළ අපහාසයක් විදිහට සළකලා ක්‍රියාකරන්න හැකියාව තියනවා.

කොහොම වුණත් මේ දෝෂාභියෝගය ආණ්ඩුවේ අවශ්‍යතාවක් වෙනුවෙන් ඉදිරිපත් වුණ එකක් බව පැහැදිලියි. එහෙම නැතිනම් ජනාධිපතිවරයාට පුළුවන් පාර්ලිමේන්තු සභාවාරය අවසාන කිරීම වැනි පියවරකින් දෝෂාභියෝග යෝජනාව

***දෝෂාභියෝග විභාගයෙන් යුක්තියක් සාදාරණයක් ඉෂ්ඨ වෙයි කියලා අපේක්ෂා කරන්න හැකියාවක් නම් නැහැ.***

අවලංගු කරන්න. අගවිනිසුරු සරත් සිල්වාට විරුද්ධව දෝෂාභියෝගයක් ඉදිරිපත් වුණ වෙලාවෙ චන්ද්‍රිකා ජනාධිපතිනිය එහෙම කරලා දෝෂාභියෝග යෝජනාව අවලංගු කෙරෙව්වා. නමුත් මෙතනදි එවැන්නක් සිදුවුණේ නෑ. ඒ වගේම අගවිනිසුරුවරියට විරුද්ධව දෝෂාභියෝගයක් ගේන්න හේතුව 'දිවි නැගුම' පනතට විරුද්ධව ඉදිරිපත් වුණ නඩුවේදී ලබා දුන්න තීන්දුව බව ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් ප්‍රසිද්ධියේ කියලා තිබුණා. ඒ නිසා මේ දෝෂාභියෝගය ආණ්ඩුවේ වුවමනාවක් බව පැහැදිලියි.

දෝෂාභියෝගය සම්බන්ධයෙන් අගවිනිසුරුවරිය ක්‍රියා කළ ආකාරය ගැන දැන් විවේචන එල්ල වෙමින් පවතිනවා. චෝදනා 14ක් තියාගෙන නඩු අහන්න ලැජ්ජා නැත්ද කියලා රට වටේ පෝස්ටර් අලවනවා. හඩ්සන් සමරසිංහ, මහින්ද අබේසුන්දර වගේ අය යොදාගෙන ඉතාම පහත් ලෙස ඇයට අපහාස කරමින් සිටිනවා. මේ සියල්ල ආණ්ඩුවේ වැඩ.

දෝෂාභියෝගය සම්බන්ධයෙන් අගවිනිසුරුවරියගේ ක්‍රියාකළාපය ගැන අපිට කතාකරන්න වෙන්නේ මේ පසුබිම තුළ ඉඳගෙනයි. ආණ්ඩුවේ මේ වැඩපිළිවෙළ නිසා අගවිනිසුරුවරියගේ කීර්ති නාමයට විශාල හානියක් සිදුව තිබෙනවා. චෝදනාවක් එල්ල වූ පමණින් යමෙක් වැරදිකරුවෙක් වෙන්නේ නෑ කියන එක හැමෝම වගේ දන්න නීතිමය සිද්ධාන්තයක්. ඒ නිසා චෝදනා විභාගයකින් වැරදිකරුවකු වෙන්නට කලින් වැරදිකරුවකු ලෙස තමන් හංවඩුගසන විට ඒ ගැන යම් කරුණු පැහැදිලි කරන තැනකට එතුමිය ගිහින් තියනවා. ඒ නිසා ඇයගේ නීතිඥයන් මාර්ගයෙන් සිදුකළ ඒ කරුණු දැක්වීම වරදක් විදිහට දකින්න බෑ.



ආණ්ඩුවට අගවිනිසුරුවරිය වහාම ගෙදර යවලා තමන්ට කැමති ආකාරයට නඩු විසඳන අගවිනිසුරුවරයෙක් පත්කරගන්න හදිස්සියක් තිබෙනවා විය හැකි වුණත් ඇයව වහාම ධුරයෙන් ඉවත් කළ හැකි ප්‍රතිපාදනයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නැහැ. තියන එකම ක්‍රමය තමයි දෝෂාභියෝගය. එය පහසු සහ ඉක්මන් ක්‍රමවේදයක් නෙවෙයි. දුෂ්කර සහ කල්ගතවෙන ක්‍රම වේදයක්. නමුත් ආණ්ඩුවට එය ඉවසා සිටින්නට වෙනවා. මොකද දෝෂාභියෝගයක් ඉදිරිපත් වුවහොත් ඉහළ අධිකරණයේ විනිසුරුවරුවන් ධුරයෙන් ඉවත් විය යුතුයි කියලා ව්‍යවස්ථාවේ නැහැ. චූදිත විනිසුරුවන්ගේ සේවය අත්හිටුවලා වැඩ බලන්නට වෙනත් කෙනෙකු පත්කළ හැකියි කියලා ව්‍යවස්ථාවේ නැහැ. එහෙම යමක් කෙරෙනවා නම් ඒක සම්පූර්ණයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව කරන ක්‍රියාවක්. ඒ නිසා ආණ්ඩුවට සිදුවෙනවා දෝෂාභියෝගයට ඉදිරියට යන්න දීලා ඉවසාගෙන ඉන්න.

නමුත් දෝෂාභියෝගය විභාගයෙන් යුක්තියක් සාදාරණයක් ඉෂ්ඨ වෙයි කියලා අපේක්ෂා කරන්න හැකියාවක් නම් නැහැ. තේරීම් කාරක සභාවේ සංයුතිය අනුව වැඩි සංඛ්‍යාවක් ඉන්නේ ආණ්ඩුව නියෝජනය කරන අය. මේක අසාදාරණයි තමයි. ඒත් මොකද කරන්නේ. මේක තමයි කටයුතු සිද්ධවෙන ක්‍රමය. මේ අසාදාරණය නිවැරදි කරන්න නම් ක්‍රමය වෙනස් කරනවා ඇරෙන්න වෙනත් කළ හැකි දෙයක් නෑ.